# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල
**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

**Business Studies**

**නිපුණතාවය 8.0**

**ව්‍යාපාරවල පැවත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාවය තහවුරු කරයි.**

---

# රක්ෂණය

**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය : ටී. පී. ජේ. එන්. වලනි**
**ර/ බළ/ ආනන්ද මෛත්‍රීය මධ්‍ය මහා විද්‍යාලය**

**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

**නිපුණතා මට්ටම 8.1 :** ව්‍යාපාරවල පැවැත්මට හේතු වන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- අවදානම යන්න පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලට මුහුණ දීමට සිදු විය හැකි අවදානම් ලැයිස්තුවක් පිළියෙල කරයි
- රක්ෂණය යන්න හඳුන්වයි.
- රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නො හැකි අවදානම් ලෙස අවදානම් වර්ග කරයි.
- රක්ෂණය කළ හැකි අවදානම් යන්න පැහැදිලි කර නිදසුන් දක්වයි.
- රක්ෂණය කළ නො හැකි අවදානම් යන්න පැහැදිලි කර නිදසුන් දක්වයි.
- ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.
- රක්ෂණ ගිවිසුම යන්න පැහැදිලි කරයි.
- රක්ෂණ ගිවිසුමට සම්බන්ධ පාර්ශ්ව හඳුන්වයි.
- රක්ෂණ ගිවිසුමක ඇතුළත් වන කරුණු ලැයිස්තුගත කරයි.

# ව්‍යාපාර වල පැවැත්මට රක්ෂණ සේවාවේ වැදගත්කම

## රක්ෂණයේ පසුබිම

17 වන සියවසේ මුල්භාගයේ පමණ ජාත්‍යන්තර වෙළඳාමේ නියැලෙන නැව් මුහුදුබත් වීමෙන් සිදු වූ පාඩුව නැව් හිමියන්ට තනිව විඳ දරා ගැනීම ඉමහත් පාඩුවක් විය. එබැවින් නැව් හිමියන් එකතු වී අරමුදලක් පිහිටුවා ගත් අතර නාවික ප්‍රවාහනයේදී අනතුරට පත් වන නැව් සඳහා වන පාඩුව පිරිමසා ගැනීමට එම අරමුදලින් මුදල් ලබා දෙන ලදී. මෙය ක්‍රමයෙන් දියුණු වී රක්ෂණ ව්‍යාපාරය දක්වා වර්ධනය විය.

## රක්ෂණය නිර්වචනය කිරීම

(I) “රක්ෂණය යනු රක්ෂිතයා විසින් ගෙවනු ලබන වාරිකය ප්‍රතිඡ්ඨාව ලෙස සලකා රක්ෂිත උපද්‍රවයක් හේතුවෙන් රක්ෂිතයා වෙත අලාභයක් ගෙවීමට රක්ෂකයා එකග වන රක්ෂිතයා හා රක්ෂකයා අතර ඇති කර ගත් ගිවිසුමකි ”

(II) “ රක්ෂිතයා විසින් වාරික ගෙවීමටත්, රක්ෂිත උපද්‍රව හේතුවෙන් රක්ෂිතයාට සිදු විය හැකි අලාභ සඳහා රක්ෂකයා විසින් වන්දි ගෙවීමටත්, රක්ෂිතයෙකු හා රක්ෂකයෙකු අතර ඇති කරගන්නා එකගතාව රක්ෂණය ලෙස හැඳින්විය හැකිය.”

**අවදානම**

අවදානම යනු මුල්‍යමය අලාභ සිදුවීමට ඇති සම්භාවිතාවයි.

**අවදානම්**

| රක්ෂණය කළ හැකි අවදානම් | රක්ෂණය කළ නොහැකි අවදානම් |
| --- | --- |
| ➢ ගොඩනැගිලි ගිනි ගැනීම | ➢ ව්‍යාපාර පාඩු ලැබීම |
| ➢ රථ වාහන අනතුරු අවදානම් | ➢ ස්වභාවික හේතු නිසා ඇති වන අවදානම් |
| ➢ මාර්ගස්ථ මුදල් වලට සිදු වන හානි | ➢ තම හැකියා හා ශක්තිය මත තීරණය වන අවදානම් |
| ➢ ණය ගැතියෙකුගෙන් ලැබිය යුතු මුදල් නොලැබී යාම | ➢ මෝස්තර වෙනස්වීම නිසා සිදු වන අවදානම් |

- **රක්ෂණය කළ හැකි අවදානමක් ලෙස පිළි ගැනීමට සපුරාලිය යුතු නිර්ණායක**

(i) අවදානම පුරෝකථනය කළ හැකි වීම.

(ii) අවදානම අහඹු ලෙස සිදු වීම.


(iii) සම්බන්ධතාවයකින් තොරවීම, එනම් සිදු වු පාඩුව වෙනත් රක්ෂිත අලාභ හා සම්බන්ධ නොවිය යුතුය.

(iv) සත්‍යාපනය කළ හැකි වීම, එනම් නිතී විරෝධි නොවිය යුතුය.

(v) රක්ෂණ අයිතියක් තිබිය යුතු වීම.

(vi) අලාභය සිදුවීමේ හේතුව,ස්ථානය, වේලාව විශ්ලේෂණය කිරිමට හැකි වීම.

- **ව්‍යාපාර වල පැවැත්ම සඳහා රක්ෂණයේ වැදගත්කම**




- **රක්ෂණ ගිවිසුම**

  රක්ෂණ ආවරණයක් අපේක්ෂා කරන්නෙකු නියමිත යෝජනා පත්‍රයක් පිළියෙල කොට රක්ෂණ සමාගමට ඉදිරිපත් කළ විට එය රක්ෂණ සමාගම විසින් පිළිගත් පසු යෝජිත ගණුදෙනුකරු ප්‍රතිෂ්ඨාව ගෙවීමත් සමාගම නෛතිකව දෙදෙනා අතර සම්පූර්ණ වන ලිඛිත හකගතාව රක්ෂණ ගිවිසුමකි.

- **රක්ෂණ ඔප්පුව**

  කිසියම් ජීවිතයකට හෝ දේපළකට අදාළව රක්ෂණ ගිවිසුමක් ඇති වු පසුව ඊට අදාලව රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතිකයයි.

## රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශව

**පළමු පාර්ශවය**

- රක්ෂණය ලද පුද්ගලයා (රක්ෂිතයා)

**දෙවන පාර්ශවය**

- රක්ෂණාවරණය සලසන පුද්ගලයා රක්ෂණ සමාගම (රක්ෂකයා)

**තෙවන පාර්ශවය**

- පළමු හා දෙවන පාර්ශවය හැර ගිවිසුමට බලපාන අනෙකුත් පාර්ශව
  - (I) රක්ෂණය වූ පුද්ගලයා යටතේ යැපෙන්නන්
  - (II) වාහන අනතුරකදී අනතුරට ලක් වල අනෙකුත් පුද්ගලයන්

## රක්ෂණ ගිවිසුමක් වලංගු වීමට තිබිය යුතු මූලිකාංග


- නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස
- රක්ෂණ යෝජනාව - අර්පනය
- ප්‍රතිග්‍රහනය හෙවත් පිළිගැනීම.
- ප්‍රතිෂ්ඨාව හෙවත් රක්ෂිත මුදල හා වාරික ගෙවීම.
- ඒ ඒ පාර්ශ්වයන්ට නෛතික බැඳිමක් ඇති කර ගැනීමේ හැකියාව
- රක්ෂණ නිතීයට අදාළ වූ නෛතිකභාවය

**නිපුණතා මට්ටම 8.2 :** රක්ෂණයේ ප්‍රායෝගික භාවිතය සඳහා ඉවහල් වන රක්ෂණ මූලධර්ම විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- රක්ෂණ මූලධර්ම ලැයිස්තුගත කරයි.
- රක්ෂ්‍ය හිමිකම නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- රක්ෂණ ගිවිසුමක දී උපරිම සද්භාවයෙන් යුතු ව කටයුතු කිරීමේ අවශ්‍යතාව තහවුරු කරයි.
- රක්ෂිත දේපළකට සිදු වූ හානියක් සම්බන්ධ ව වන්දි ගෙවීමේ දී හානිපූර්ණ මූලධර්මයේ බලපෑම පැහැදිලි කරයි.
- ආදේශන මූලධර්මය හඳුන්වා ඒ සඳහා නිදසුන් දක්වයි.
- දායකත්ව මූලධර්මය හඳුන්වා ඒ සඳහා නිදසුන් දක්වයි.
- වනදී ගෙවන අවසථ ාවක දී ආසනත් ම හෙත් වු බලපාන ආකාරය පැහැදිලි කරයි
- රක්ෂණයට, රක්ෂණ මූලධර්ම වැදගත් වන ආකාරය අගය කරයි.
- දෙන ලද සිද්ධි ඇසුරෙන් රක්ෂණ මූලධර්ම පැහැදිලි කරයි.
- ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය යන්න පැහැදිලි කරයි.



## රක්ෂ්‍ය හිමිකම

යම් වස්තුවක් හෝ දේපලක් තමා සතු වීමෙන් ආර්ථික වාසියක් ද අහිමි වීමෙන් අවාසියක් ද ඇති වන දෙයකට ඇති හිමිකම රක්ෂ්‍ය හිමිකම නම් වේ.

රක්ෂ්‍ය හිමිකමක් ඇති වීමට සම්පූර්ණ විය යුතු කරුණු

- මානව හෝ භෞතික දේපල අහිමි වීමෙන් මුල්‍යමය පාඩුවක් සිදුවීම.
- මානව හෝ භොතික දේපලට ඇති අයිතිය නිතිය මගින් සනාථ කළ හැකි වීම.
- සිදුවන අවාසිය මුදලින් තක්සේරු කළ හැකි මුල්‍යමය වටිනාකමක් තිබීම.
- නිත්‍යානුකුල වගකීමක් තිබීම හා වංචනික තත්වයකට අවස්ථා නොතිබිම.

  උදා -

  - තමාට තමාගේ ජීවිතය
  - සේවා යෝජකයාට තම සේවකයාගේ ජීවිතය
  - ස්වාමි පුරුෂයාගේ ජිවිතය පිළිබඳ භාර්යාවටත් භාර්යාවගේ ජීවිතය පිළිබඳ ස්වාමි පුරුෂයාටත් රක්ෂ්‍ය හිමිකමක් ඇත.
  - ණය හිමියෙකුට ණය ගැතියෙකුගේ ජීවිතයකට ණය ප්‍රමාණය දක්වා රක්ෂණය කිරිමට හිමිකමක් ඇත.
  - බස් රථ රියදුරෙකුට ගමන් ගන්නා මගීන්ගේ ජීවිතේ පිලිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.

## උපරිම විශ්වාසය

රක්ෂිතයා හා රක්ෂකයා අතර රක්ෂණ ගිවිසුමට සම්බන්ධ සියළු තොරතුරු සැගවීමකින් තොරව නොසගවා හෙළි කළ යුතු බව උපරිම විශ්වාසය යන මුලධර්මයෙන් ප්‍රකාශ වේ.

උදා -: ජීවිත රක්ෂණයේදී තමාට පවතින රෝග පිලිබඳ හෙළි කළ යුතුය.

## භානි පූර්ණය

රක්ෂණයේදී යම් දේපලකට හානියක් සිදු වුවහොත් එම දේපළ යථා තත්වයට පත් කිරිම සඳහා පමණක් ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවන බව හානි පුර්ණ මුලධර්මයෙන් ප්‍රකාශ වේ. මේ මගින් රක්ෂණයෙන් ලාභ ලැබීමට රක්ෂිතයාට ඇති හැකියාව වලක්වා ඇත.

උදා -: රු. 50,00000 ක් වටිනා ගොඩනැගිල්ලක් එම මුදලට රක්ෂණය කර ඇති අවස්ථාවක රු. 25000ක හානියක් වු විට වන්දි වශයෙන් රු.25000 ක් පමණක් ලැබීම.

## ආසන්නම හේතුව

හානියක් ආවරණය කිරිම පිණිස වන්දි ගෙවිමේදී එම හානිය සිදු වීමට බලපාන ලද මුලික හේතුව එකී රක්ෂණ ගිවිසුමෙන් ආවරණය වී ඇත්නම් පමණක් එම හානිය වෙනුවෙන් වන්දි ගෙවන බව මෙයින් ප්‍රකාශ වේ.

උදා -: ගිනි රක්ෂණ ඔප්පුවක් පමණක් හිමි ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාරයට සොර සතුරන්ගෙන් වන හානි සඳහා වන්දි ලබා ගත නොහැක.

## ආදේශනය

යම් හානියක් වෙනුවෙන් රක්ෂිතයාට මාර්ග ගණනාවකින් ප්‍රතිලාභ ලබා ගැනීමට ඇති අවස්ථාවක ඔහුට එක් අවස්ථාවක් පමණක් ප්‍රයෝජනයට ගනිමින් හානිය පුර්ණය කර ගැනීමට ඇති අයිතිය ආදේශනය නම් වේ.

උදා -: මෝටර් රථ රක්ෂණයේදී මෝටර් රථය සම්පුර්ණයෙන් හානියට පත් වු අවස්ථාවක මෝටර් රථය වෙනුවෙන් සම්පුර්ණ වන්දි මුදලම ගෙවන අතර මෝටර් රථයේ සුන්බුන් වටිනාකම රක්ෂණ සමාගම පවරා ගනී.

## දායකත්වය

එකම දේපලක් රක්ෂණ ආයතන කීපයක රක්ෂණය කර ඇති විටක හානියක් සිදු වු විටදී එම ආයතන එක්ව දායකත්වය දරමින් සිදු වු අලාභය පුර්ණය කිරිම දායකත්වය මුලධර්මයෙන් ප්‍රකාශ වේ.

උදා -: රුපියල් ලක්ෂ 10 ක මෝටර් රථයක් A,B,C රක්ෂණ ආයතන වල රුපියල් ලක්ෂ 5 රුපියල් ලක්ෂ 3 රුපියල් ලක්ෂ 2 බැගින් රක්ෂණය කර ඇති විටක එම මෝටර් රථයට රුපියල් 100000 ක හානියක් සිදු වු විට 5:3:2 අනුපාතයට A,B,C යන රක්ෂණ ආයතන තුන 50000 , 30000 හා 20000 වශයෙන් වන්දියට දායක වේ.

## ප්‍රාරක්ෂණය

වටිනාකමින් ඉහල වත්කම් සඳහා ඇති විශාල අවදානමක් කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාරදීම හා අනතුරක් සිදු වු විට තමන් භාර ගත් අවදානමේ ප්‍රමාණයට ඒ ඒ රක්ෂණ සමාගම් වන්දි ගෙවීම ප්‍රාරක්ෂණය ලෙස හඳුන්වයි.

## ප්‍රතිරක්ෂණය

රක්ෂකයෙකු විසින් භාර ගන්නා ලද අවදානමක් තවත් රක්ෂකයෙකු යටතේ නැවත රක්ෂණය කිරිමයි.

# ව්‍යාපාර වල විවිධ අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පු වර්ග

**රක්ෂණයේ විවිධ ප්‍රභේද**

- **ජීවිත රක්ෂණය (දිගුකාලීන රක්ෂණය)**
- **සාමාන්‍ය රක්ෂණය (හදිසි අනතුරු රක්ෂණය)**
  - ගිනි රක්ෂණය
  - සොරබිය රක්ෂණය
  - ස්වාභාවික විපත් රක්ෂණය
  - සමුද්‍රීය රක්ෂණය
  - මෝටර් රථ රක්ෂණය
  - වගකීම් රක්ෂණය
  - මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
  - මාර්ගස්ථ මුදල් රක්ෂණය

## ජීවිත රක්ෂණය. (Life Insurance)

පුද්ගලයෙකුගේ මරණය හෝ ශාරීරික උපද්‍රවයක් මුල් කරගෙන ඇති වන අවදානම් තත්වයකදී එම අවදානමට ගොදුරු වූ පුද්ගලයාට හෝ ඔහුගේ යැපෙන්නන්ට මූල්‍යමය ප්‍රතිලාභ සැලසීමයි. මරණය, අකර්මන්‍යතාවයට හෝ මහලු වියට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පුද්ගලයෙකුට සිදු විය හැකි හානි වෙනුවෙන් ආරක්ෂාව සැලසීම ජීවිත රක්ෂණයේ අරමුණයි.

නිශ්චිත කාලසීමාවක් සඳහා ජීවිත රක්ෂණය ලබා ගන්නා අතර එම කාලසීමාව තුළ රක්ෂිතයා මියගිය හොත් ඔප්පුවේ මුළු වටිනාකම යැපෙන්නන්ට හෝ නම් කළ පුද්ගලයාට හිමි වන අතර රක්ෂිතයා එකී කාලසීමාව අවසන් වන තෙක් ජීවත් ව සිටියහොත් කාලසීමාව අවසානයේ රක්ෂණ ඔප්පුවේ වටිනාකම හා ප්‍රතිලාභ රක්ෂිතයාට ලබා ගත හැකිය.

## ජීවිත රක්ෂණය සෙසු රක්ෂණ වලින් වෙනස් වන ආකාරය

| ජීවිත රක්ෂණය | දේපළ රක්ෂණය |
|---|---|
| 01. පුද්ගලයෙකු හා සම්බන්ධ වේ. ඕනෑම මුදලකට රක්ෂණය කළ හැකිය. | 01. වත්කම් හෝ දේපළ සම්බන්ධ වේ. දේපළ තක්සේරු වටිනකම දක්වා රක්ෂණය කිරිම සිදු කෙරේ. |
| 02. නිශ්චිත අවධානමකි. | 02. නිශ්චිත අවධානමක් නොවේ. |
| 03. දායකත්වය, ආදේශනය, හානි පූර්ණය යන මුලධර්ම බලනොපායි. | 03. හානි පූර්ණය, දායකත්වය, ආදේශනය යන මූළ ධර්ම බලපායි. |
| 04. සෑම හානියක්ම යථා තත්වයට පත් කළ හැක. | 04. සෑම හානියක්ම යථා තත්වයට පත් කළ හැක. |
| 05. ඉතිරි කිරීමකට සමානය. ගිවිසුම දිගුකාලීන ස්වරූපයක් ගනී. | 05. අනතුරකදී පමණක් වන්දි ලැබේ. සාමාන්‍යයෙන් කෙටිකාලීන වේ. |
| 06. ජීවිත රක්ෂණ ඔප්පු පැවරිය නොහැක. | 06. දේපළ රක්ෂණ ඔප්පු පැවරිය හැකිය. |

# සාමාන්‍ය රක්ෂණය

## (I) ගිනි රක්ෂණය (Fire Insurance)

මේ යටතේ යම් පුද්ගලයෙකුට හෝ දේපල හා වත්කම් වලට ගින්නෙන් සිදු විය හැකි හානි ආවරණය කරගත හැකිය. ගිනි රක්ෂණය යටතේ ගිනි හානි රක්ෂණ ඔප්පුව දිර්ඝ කර පහත අවධානම් ද ආවරණය කර ගැනීමට හැකියාව ලැබේ.

- ❖ කැරලි කෝලාහල හා වැඩ වර්ජන හානි
- ❖ පිපිරීම් හානි
- ❖ විදුලිමය ආපදා හානි
- ❖ භූමිකම්පා/ සුනාමි
- ❖ ජල ගැලීම්, සුළි සුළං, කුණාටු වැනි
- ❖ ගුවන් යානා අනතුරු
- ❖ ගැටීම් හානි
- ❖ අනුශාංගික අලාභ හානි

## අනුශාංගික අලාභ රක්ෂණය

ගිනි උවදුරක් සිදුවීම නිසා දේපලකට හෝ සත්‍ය අලාභයට අමතරව ව්‍යාපාර කටයුතු අඩාල වීමේ අලාභයන්ට ද වන්දි ගෙවන රක්ෂණ ඔප්පුවයි. ප්‍රධාන අලාභයට අමතර ගෙවීම් කරනු ලබන අලාභය අනුශාංගික අලාභය වේ.

උදා : ලාභය අහිමි වීම

ගින්න නිවීමට ගත් උත්සහය නිසා වන අලාභය

ගින්න මැඩපැවැත්වීම සඳහා දරන වියදම

## (II) සොරබිය රක්ෂණය (Theft Insurance)

දේපල වලට සොර සතුරන්ගෙන් වන හානි ආවරණය කර ගැනීම සඳහා සොරබිය රක්ෂණ ඔප්පු ලබාගත හැකිය.

## (III) ස්වභාවික විපත් රක්ෂණය (Natural Disaster Insurance)

දේපල වලට කුණාටු වැනි දේ වලින් සිදු වන හානි ආවරණය සඳහා ස්වාභාවික විපත් රක්ෂණාවරණයක් ලබා ගැනීමට හැකිය.

## (IV) සමුද්‍රීය රක්ෂණය (Marine Insurance)

මුහුදු ප්‍රවාහනයේ නිරත නෞකා වලට හෝ නැව්ගත භාණ්ඩ වලට මුහුදේදී ඇති විය හැකි හානි සඳහා ගන්නා රක්ෂණයයි. මෙය මූලික කොටස් දෙකකි.

**සමුද්‍රීය රක්ෂණය**

**නැව් කඳ රක්ෂණය** (Hull)

**රක්ෂණය** (Cargo)

- ❖ සියලු අවදානම් ඔප්පුව
- ❖ පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව

  චල ඔප්පුව
- ❖ තොටුපල ඔප්පුව

  ඔප්පුව
- ❖ අලුත්වැඩියා ඔප්පුව
- ❖ තැනීම් හානි ඔප්පුව

**නැව් බඩු**

- ❖ ඇගයු ඔප්පුව
- ❖ විවෘත ඔප්පුව/
- ❖ අනාගත ආවරණ

## නැව් කඳ රක්ෂණය.

නැව් කඳ විනාශ වී යාම, මුහුදු බත් වීම, ගිනිබත් වීම වැනි නැවට සිදුවන සියලුම හානි ආවරණය කෙරේ. මේ යටතේ පහත සඳහන් රක්ෂණ ඔප්පු වර්ග ලබා ගත හැකිය.

### සියලු අවදානම් ඔප්පුව

නැව් කඳට සිදුවන සියලුම අවදානම් ආවරණය වන රක්ෂණ ඔප්පුව සියලු අවදානම් ඔප්පුව ලෙස හැඳින්වේ.

### පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව

නිශ්චිත ස්ථාන දෙකක් අතර යාත්‍රා කිරිමේදී නැව් කඳට සිදුවන උවදුරු ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පුවයි.

### තොටුපල ඔප්පුව

තොටුපලක නවතා තැබීමේදී නැව් කඳට සිදුවන හානි ආවරණය කෙරේ.

### අලුත්වැඩියා ඔප්පුව

නැව් කඳ අලුත්වැඩියා කිරිමේදී සිදුවන හානි ආවරණය කිරිම සඳහා ලබා ගන්නා ඔප්පුවයි.

### තැනීම් හානි ඔප්පුව

නැව් කඳ තැනීමේදී සිදුවන හානි ආවරණය කිරිම සඳහා ලබා ගන්නා ඔප්පුවයි.

## නැව් බඩු රක්ෂණය.

නැවේ ගෙන යන භාණ්ඩ සඳහා වන හානි ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පුවයි.ඒ සඳහා පහත සඳහන් රක්ෂණ ඔප්පු වර්ග ලබා ගත හැකිය.

### ඇගයු ඔප්පුව

සඳහන් කරන ලද නිශ්චිත කාලසීමාවක් තුළ නැව් බඩු අපේක්ෂිත තොගයේ වටිනාකමට ගනු ලබන රක්ෂණ ඔප්පුවයි.

### විවෘත ඔප්පුව / චල ඔප්පුව

නැව්ගත කිරිමට අපේක්ෂිත මුළු භාණ්ඩ තොගය සඳහා පොදුවේ ලබා ගන්නා රක්ෂණාවරණයයි.

### අනාගත ආවරණ ඔප්පුව

යම් කාලයක් තුළ නැව්ගත විය හැකි භාණ්ඩ වල වටිනාකම උපරිමයකට අගය කර බඩු නැව්ගත වීම ආවරණය කෙරෙන රක්ෂණාවරණයයි.

## මෝටර් රථ රක්ෂණය
## Motor Traffic Insurance

රථවාහන අනතුරු වලින් රථවාහන වලටත් එහි ගමන් ගන්නා අයටත් බාහිර දේපල වලටත් බාහිර පුද්ගලයින්ටත් සිදුවිය හැකි හානි ආවරණය කිරිම සඳහා ලබා ගන්නා රක්ෂණාවරණය මෝටර් රථ රක්ෂණයයි. මේ යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග

- **පූර්ණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව (විස්තීර්ණ රක්ෂණ ඔප්පුව)**

  රථයට, රථයේ ගමන් ගන්නන්ට, බාහිර පුද්ගලයින්ට හා දේපල වලට සිදුවන සියලුම අලාභ ආවරණය කෙරෙන රක්ෂණයයි.

- **තෙවන පාර්ශ්ව ගිනි හා සොරබිය රක්ෂණය**

  බාහිර ජීවිත වලට හා බාහිර දේපල වලට වන හානි වලට අමතරව අදාළ වාහනයට ගින්නෙන් හා සොරකම් වලින් වන හානි ද ආවරණය කෙරේ.

- **අවම තෙවන පාර්ශ්ව රක්ෂණය**

  මෝටර් රථය මහා මාර්ගයේ ගමන් කිරිම නිසා මාර්ගයේ ගමන් ගන්නා පුද්ගලයන්ට හා දේපළ වලට සිදුවන හානි ආවරණය කෙරේ.

# වගකීම් රක්ෂණය
# The Liability Insurance

යම් පාර්ශ්වයක් යම් කාර්යයක යෙදී සිටින විට ඒ හේතුවෙන් බාහිර පාර්ශ්ව වලට සිදුවන අනපේක්ෂිත උපද්‍රව සඳහා වන්දි ගෙවීමට ලබා ගන්නා රක්ෂණය වගකීම් රක්ෂණය වේ. මේ යටතේ පහත සඳහන් රක්ෂණ ඔප්පු වර්ග ලබා ගත හැකිය.

❖ **පොදු (මහජන) වගකීම් රක්ෂණය ( General Liability Insurance)**

ව්‍යාපාර කටයුතු හෝ දේපළ වලින් පැන නැගිය හැකි අහඹු සිද්ධියක් නිසා තුන්වන පාර්ශ්වයට සිදු විය හැකි හානි වෙනුවෙන් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

❖ **නිෂ්පාදන වගකීම් රක්ෂණය ( Product Liability Insurance)**

යම් ව්‍යාපාරයක් අලෙවිකරණ නිෂ්පාදිත පරිභෝජනය කිරිමෙන් පාරිභෝගිකයින්ට සිදුවිය හැකි හානි ආවරණය කිරිම සඳහා ව්‍යාපාරිකයින් විසින් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

❖ **සේව්‍ය වගකීම් රක්ෂණය ( Employer Liability Insurance)**

සේවකයින්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම සේව්‍යාගේ වගකීමක් වන අතර ඒ සඳහා ලබා ගන්නා රක්ෂණාවරණය සේව්‍ය වගකීම් රක්ෂණය නම් වේ.

❖ **මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය**

ගොඩබිම භාණ්ඩ ප්‍රවාහනයේදී සිදු විය හැකි හානි ආවරණය මේ යටතේ සිදු කරයි. භාණ්ඩ වාහනයට පැටවූ අවස්ථාවේ සිට බාන අවස්ථාව දක්වා සිදුවන හානි ආවරණය සඳහා මෙම රක්ෂණාවරණය ලබා ගනී.

❖ **මාර්ගස්ථ මුදල් රක්ෂණය**

එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මුදල් රැගෙන යාමේදී විය හැකි හානි ආවරණය සඳහා ලබා ගන්නා රක්ෂණයයි.

# රක්ෂණය මාතෘකාවට අදාළ පසුගිය විභාග ප්‍රශ්න

**(2002 උසස් පෙළ)**

- "රක්ෂණය" යනු අවදානම් ඒකරාශි කිරීමකි. පැහැදිලි කරන්න.

**(2007 උසස් පෙළ)**

- රක්ෂණය කළ හැකි අවදානමක් ලෙස පිළිගැනීමට සපුරාලිය යුතු නිර්ණායක කවරේද?

**(2006 උසස් පෙළ)**

- රක්ෂණය කළ හැකි අවදානම් හඳුනා ගැනීම සඳහා භාවිතා කරන නිර්ණායක නම් කර පැහැදිලි කරන්න.

**(2003 උසස් පෙළ)**

- රක්ෂණය කළ හැකි අවදානම් සහ රක්ෂණය කළ නොහැකි අවදානම් නිදසුන් සහිතව දක්වන්න.

**(2012 උසස් පෙළ)**

- රක්ෂණයෙන් පුද්ගලයාට හා පවුලටත් ව්‍යාපාර වලටත් ලැබෙන ප්‍රතිලාභ මොනවාද?

**(2010 උසස් පෙළ)**

- රක්ෂණ මූලධර්ම ලෙස සැලකෙන රක්ෂණ හිමිකම, උපරිම විශ්වාසය සහ ආසන්නතම හේතුව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

**(2017 උසස් පෙළ)**

- පියසිරි විසින් දරුකමට හදාගනු ලැබූ වසන්ත වෙනුවෙන් ජීවිත රක්ෂන ඔප්පුව ලබාගෙන තිබුණි. එහෙත් ළමා කාලයේ සිට පැවති රෝගයකින් වයස අවුරුදු 26 දී වසන්ත මිය ගියේය. පියසිරි විසින් වසන්තගේ ජීවිත රක්ෂණ ඔප්පුවට වන්දි ලබා ගැනීමට යාමේදී ඇති විය හැකි ගැටළු දෙකක් රක්ෂණ මූලධර්ම පදනම් කරගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.

**(2014 උසස් පෙළ)**

- රක්ෂණ ව්‍යාපාරයේ සඵලදායීතාවයට රක්ෂණ මූලධර්ම වැදගත් වේ. එම රක්ෂණ මූලධර්ම හතරක් ලියන්න.

**(2014 උසස් පෙළ)**

- ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය ලෙස හඳුන්වන්නේ මොනවාද?

**(2004 උසස් පෙළ)**

- ජීවිත රක්ෂණය හා සෙසු උවදුරු රක්ෂණය අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

**(2015 උසස් පෙළ)**

- ජීවිත රක්ෂණ වන්දියක් ලබා ගැනීමට යාමේදී රක්ෂිතයාට මුහුණ දීමට සිදු විය හැකි ගැටළු දෙක බැගින් පැහැදිලි කරන්න.

**(2002 උසස් පෙළ)**

- හදිසි අනතුරු රක්ෂණ මෑත කාලයේ රක්ෂණ ක්ෂේත්‍රයේ බෙහෙවින් ව්‍යාප්ත වී ඇති අංශයකි. මේ ක්ෂේත්‍රය යටතේ ආවරණය වන විවිධ අවදානම් සඳහන් කරන්න.

**(2007 උසස් පෙළ)**

- මෝටර් රථ හිමියෙකු විසින් අනිවාර්යෙන් ලබා ගත යුතු රක්ෂණ ආවරණය කුමක්ද? එම රක්ෂණයෙන් ආවරණය කෙරෙන අවදානම් කවරේද?

**(2015 උසස් පෙළ)**

- මෝටර් රථ රක්ෂණ වන්දියක් ලබා ගැනීමට යාමේදී රක්ෂිතයාට මුහුණ දීමට සිදු විය හැකි ගැටළු දෙක බැගින් පැහැදිලි කරන්න.

**(2014 උසස් පෙළ)**

- සම්පත්ගේ මෝටර් රථය අනතුරකට පත්වීමෙන් සිදු වු අලාභය රු. 1,200,000 ක් ලෙස තක්සේරු කර ඇත. මෙම මෝටර් රථය රු.2,000,000 ක් වටිනා අතර, එය රු. 1,800,000 කට "SRC" රක්ෂණ සමාගමේ සහ රු. 1,200,000 කට (JSA) රක්ෂණ සමාගමේ රක්ෂණය කර ඇත. වාහනයේ සම්පූර්ණ අලාභය රක්ෂණ සමාගම් දෙකෙන්ම ලබා ගත හැකිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(2009 උසස් පෙළ)**

- ගිනි රක්ෂණ ඔප්පුවක් යටතේ ගින්නට අමතරව ආවරණය කරගත හැකි අවදානම් කවරේද පැහැදිලි කරන්න.

**(2009 උසස් පෙළ)**

- ගින්නට අමතරව අනුශාංගික අලාභ රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය වන අවදානම් කවරේද?

**(2015 උසස් පෙළ)**

- වෘත්තියෙන් වාදකයෙකු මෙන්ම ගායකයෙකුද වන චන්ද්‍රසිරි බොහෝ විට දේශීය සංගීත සංදර්ශන වලට තම මෝටර් රථයෙන් ගමන් කරයි. එසේම ඔහු විදේශ සංගීත සංදර්ශන වලටද සහභාගි වේ. චන්ද්‍රසිරිට මුහුණු පෑමට සිදු විය හැකි අවදානම් හතරක් සඳහන් කර එම අවදානම් වෙනුවෙන් ඔහුට ලබා ගත හැකි රක්ෂණ ඔප්පු මොනවාදැයි සඳහන් කරන්න.

**(2011 උසස් පෙළ)**

- වගකීම් රක්ෂණය යන්නෙන් කුමක් අදහස් කෙරේද?

**(2017 උසස් පෙළ)**

- මහජන වගකීම් රක්ෂණ යනු කුමක්දැයි විස්තර කර ඊට නිදසුනක සපයන්න.